**පෑලියගොඩ නගර සභාව - 2021**

**------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**-------------**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

පෑලියගොඩ නගර සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන නගර සභා ආඥා පනතේ (255 අධිකාරය) 181 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පෑලියගොඩ නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

නගර සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව නගර සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---------------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ නගර සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ නගර සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, නගර සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව නගර සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6(I)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අංක 6.11 පරිදි සමාලෝචිත වර්ෂය සඳහා දේපළ පිරියත හා උපකරණ ක්ෂය කර නොතිබුණි.<br><br>(ආ) අංක 9.9 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 10 යටතේ ප්‍රාග්ධන වියදම් ප්‍රදාන ලැබීම්වලින් වර්ෂයේ කළ ගෙවීම්, අතිරික්තයේ හඳුනාගත් ප්‍රදාන ලෙස අඩුකොට ඉතිරිය ශුද්ධ වත්කම්/ ස්කන්ධය යටතේ වූ, අතිරික්තයේ හඳුනා නොගත් ප්‍රදාන යටතේ සටහන් කළ යුතු වුවද සමාලෝචිත වර්ෂය සඳහා බාහිර ආයතනයවලින් ලැබිය යුතුව තිබුණු රු.3,253,153 ක ප්‍රාග්ධන ආධාර එසේ ගිණුම්ගත කර නොතිබුණි.<br><br>(ඇ) ප්‍රමිත උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුළත් EG 3.2 යටතේ දැක්වෙන පරිදි පාරවල් සහ බෝක්කු සහ වෙනත් යටිතල පහසුකම් අයිතම් දේපළ, පිරියත හා උපකරණ යටතේ ගිණුම්ගත කළයුතු වුවද පෙර වර්ෂයේ රු.16,056,292 ක් හා සමාලෝචිත වර්ෂයේ රු.5,997,225 ක් වැයකර සංවර්ධනය කර තිබූ පාරවල්, බෝක්කු හා කාණු ගිණුම්ගත කර නොතිබුණි. | ඉදිරි වර්ෂයේදී නව ප්‍රමිතියට අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | ප්‍රමිත උදෙසා වන සවිස්තරාත්මක පහදාදීම්වල ඇතුළත් EG 3.1 ප්‍රකාරව කෙරීගෙන යන යම් ප්‍රාග්ධන වැඩ වෙතොත් ඒවා දේපළ, පිරියත හා උපකරණ ලේඛනයේ වෙනම ප්‍රභේදයක් ලෙස පෙන්විය යුතු වුවද සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන කර්මාන්ත 6 ක වටිනාකම රු.8,425,448 ක් ගිණුම්වල දක්වා නොතිබුණි. | ඉදිරි වර්ෂයෙදී නව ප්‍රමිතින්ට අනුව ගිණුම්ගත කිරීමට කටයුතු කරන බව දන්වමි. | පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව කටයුතු කළ යුතුවේ. |
| (ඉ) | අංක 3.5 අනුව හා LGD/10A/4/න.ගි/2019 අංක දරන පළාත් පාලන කොමසාරිස්ගේ 2021 පෙබරවාරි 12 දිනැති ලිපිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ස්ථාවර වත්කම් වර්ග 14 ක් යටතේ වර්ගීකරණය කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් කාණ්ඩගත කිරීම කාණ්ඩ 06 ක් යටතේ වර්ග කර තිබුණි. | වත්කම් කාන්ඩ 06 කට පමණක් අනුගත වන බැවින් නගර සභා ගිණුම් තුළ ස්ථාවර වත්කම් කාන්ඩ 06 ක් යටතේ ඉදිරිපත් කර ඇති බව දන්වමි. | |

## 1.6.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පරිගණක මෘදුකාංග වත්කමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගත් බව හෙළිදරව් කර තිබුණද සභාව විසින් භාවිතා කරනු ලබන රු.1,400,000 ක් වටිනා මෘදුකාංග පද්ධතිය ගිණුම්ගත කොට නොතිබුණි. | 2022 වර්ෂයේ ගිණුම් තුළින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව කටයුතු කළ යුතුවේ. |

## 1.6.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ හා පෙර වර්ෂයේ මිලදීගෙන තිබුණු පිළිවෙලින් රු.100,080 ක් හා රු.102,383 ක් වූ පුස්තකාල පොත් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ මිලදී ගෙන තිබූ ලී බඩු හා යන්ත්‍රෝපකරණ වටිනාකම රු.1,361,515 ක් සැපයුම් හා උපකරණ වැය ගිණුමට හර කර සංචිත ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දේපළ,පිරියත හා උපකරණ සහ අතිරික්තය එම වටිනාකමෙන් අඩුවෙන් හා සංචිත හා වෙන්කිරීම් ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| (ඇ) | නගර සභාවට පරිත්‍යාග ලෙස ලැබී තිබුණ පරිගණක යන්ත්‍ර 03 ක් සහ මුද්‍රණ යන්ත්‍රයක වටිනාකම ජංගම නොවන වත්කම් යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඈ) | රු.178,168 ක් වටිනා ලොකර් යුනිට් 2 ක් හා රු.23,000 ක් වටිනා පිත්තල පහනක් ලී බඩු සහ සවිකිරීම් යටතේ දෙවරක් ගිණුම්ගත කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ජංගම නොවන වත්කම් රු.201,168 ක් වැඩියෙන් ගිණුම්ගත | | |
| (ඉ) | ලෙජර් ගිණුමේ වර්ෂයේ වරිපනම් හා බදු ආරම්භක ශේෂය සටහන් කිරීමේදී වරිපනම් ගාස්තු රු.29,733,799 ක ශේෂය පමණක් සටහන් කර එම ගිණුම තුළ වරිපනම් හා ව්‍යාපාර බදු ආදායම් දෙවර්ගයේම ලැබීම් හා ගෙවීම් සටහන් කර තිබූ අතර බලපත්‍ර ගාස්තු ගිණුමේ 2021 දෙසැම්බර් 31 දිනට වූ ශේෂය තුළ රු.391,800 ක ව්‍යාපාර බදු ආරම්භක ශේෂයද ඇතුළත් කිරීමෙන් වරිපනම් හා ව්‍යාපාර බදු ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් හා බලපත්‍ර ගාස්තු ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි. | 2022 වර්ෂයේ අවසන් ගිණුම මගින් නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | |
| (ඊ) | ස්ථාවර තැන්පතුවක් සඳහා සමාලෝචිත වර්ෂයට අදාල පොලිය රු.139,985 ක් වුවත් රු.193,848 ක් ලෙස ගිණුම්ගත කිරීම නිසා ස්ථාවර තැන්පත් ගිණුම හා සමාලෝචිත වර්ෂයට අදාල පොලිය රු.53,863 කින් වැඩියෙන් දක්වා තිබුණි. | | |
| (උ) | සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම්, ආයෝජන හා මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනනය වන ශුද්ධ මුදල් ප්‍රවාහයේ එකතුව රු.56,474,166 ක් ලෙසද මුදල් සහ මුදල් හා සමාන දෑවල ශුද්ධ වැඩිවීම රු.45,244,473 ක් ලෙස සටහන් කර තිබුණෙන් රු.11,229,693 ක වෙනසක් නිරීක්ෂණය විය. | ඉදිරි ගිණුම් වර්ෂයේ දී නිවැරදිව සකස් කිරීමට කටයුතු කරන බව දන්වමි. | නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ. |
| (ඌ) | ප්‍රධාන ලෙජරයේ ආදායම් වියදම් ගිණුම අනුව සමාලෝචිත වර්ෂයට අදාල මෙහෙයුම් අතිරික්තය රු.33,423,228 ක් වූ අතර එය ජර්නල් සටහන් මගින් සමුච්චිත අරමුදලට බැර කර තිබුණද විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ අතිරික්තය රු.33,203,875 ක් ලෙස රු.219,352 ක් අඩුවෙන් දක්වා තිබුණි. | මෙවැනි වැරදි සිදු නොවීමට කටයුතු කරන බව දන්වමි. | |

### 1.6.4 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති ගිණුම් විෂයයන් 06 ක 2021 දෙසැම්බර් 31 දිනට ගිණුමේ ශේෂය හා උපයෝගී ලේඛන අනුව ශේෂය අතර රු.10,580,340 ක වෙනසක් නිරීක්ෂණය විය. | මෙම වෙනස ඉවත්කර ගන්නා බව දන්වා සිටිමි. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුවේ. |

### 1.7 අනුකූල නොවීම්

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| පළාත් පාලන කොමසාරිස්ගේ 2020 අගෝස්තු 24 දින LGD/09/2019(I) චක්‍රලේඛය | එල් ජී 21/2 ආකෘතියෙහි දැක්වෙන පරිදි පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමෙහි සීමා අනුමත කර ගත යුතුව තිබූ නමුත් මෙම සභාව විසින් අත්තිකාරම් ගිණුම් සීමාවන් අනුමත කර ගැනීමට කටයුතු කර නොතිබූ අතර මූල්‍ය ප්‍රකාශන සමඟ අත්තිකාරම් බී ගිණුම ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරි ගිණුම් කාල ඡේදයේදී මෙම වරද නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. | අත්තිකාරම් සීමා අනුමත කරගෙන අත්තිකාරම් බී ගිණුමක් පිළියෙල කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අතිරික්තය රු.33,203,875ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තයරු.19,210,419 ක් විය.

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

**(අ) වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2021 දෙසැම්බර් 31 දිනට අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකමින් රු.50,000 ඉක්මවා තිබූ වරිපනම් ඒකක 46 ක් වෙනුවෙන් අයවිය යුතු හිඟ වරිපනම් වටිනාකම රු.4,006,408 ක් වී තිබූ අතර එයින් 2022 අප්‍රේල් 22 දිනට එක් ඒකකයකින් රු.62,036 ක් පමණක් අයවී තිබුණි. | පිළිතුරු ලබාදී නැත. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. |

**(ආ) කුලී**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| (i) | සභාව සතු පොදු වෙළඳපල කඩ කාමර 35 කින් කඩකාමර 06 ක් සඳහා කිසිදු ගිවිසුම්ගත වීමක් සිදුකර නොතිබූ අතර 2022 මැයි 30 දිනට එම කඩ කාමරවලින් අය විය යුතු හිඟ කුලිය රු.712,100 ක් විය. කඩ කාමර 09 ක් සඳහා අත්සන් කරන ලද ගිවිසුම්වල වලංගු කාලය අවසන් වී වසර 30 කට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද නව ගිවිසුම්වලට එළඹ නොතිබූ අතර 2021 දෙසැම්බර් 31 දිනට එම කඩ කාමරවලින් අයවිය යුතු හිඟ කුලිය රු.638,950 ක් විය. අංක 15/1/2 දරන කඩ කාමරය සඳහා අත්සන් කර තිබුණු ගිවිසුමෙහි, ගිවිසුම අවසන් වන කාලයක් සඳහන් කර නොතිබූ අතර ගිවිසුම අසම්පූර්ණ වූ මෙම කඩ කාමරය වෙනුවෙන් 2021 මැයි 30 දිනට හිඟ කුලිය රු.27,500 ක් විය. | ඉදිරියේදී ගිවිසුම්ගත වීමට ආදාල කටයුතු සිදුකරන බව දන්වමි. | වලංගු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කළ යුතුවේ. |
| (ii) | පොදු වෙළඳපල කඩ කාමර අංක 25/ඒ කඩ කාමරය 1982 වර්ෂයේ සිට බදු දී තිබුණ අතර ආරම්භයේ සිට මේ දක්වා මාසික කුලිය ලෙස රු.75 ක් අයකර තිබුණි. දැනට ක්‍රියාත්මක තක්සේරු වාර්තාවේ මෙම කඩ කාමරය සඳහා තක්සේරුවක් ලබාදී නොතිබූ අතර වසර 40 ක සිට කුලී සංශෝධනය නොකිරීමට හේතු විගණනයට අනාවරණය නොකෙරුණි. | නව තක්සේරුවක් ලබා ගැනීම ඉදිරි මහා සභාවට ඉදිරිපත් කර තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු කර ගන්නා බව දන්වමි. | වර්ෂ තුනකට වරක් නව තක්සේරුවක් කළ යුතුවේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | තැපැල් කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා සභා ගොඩනැගිල්ලක් රජයේ තක්සේරුව ලබාගන්නා තෙක් රු.2,000 ක තාවකාලික තක්සේරුවක් මත කුලියට දීමට 2020 ජුනි 30 දින බදු කමිටුව විසින් නිර්දේශ කර 2020 ජූලි 10 දින මහා සභාව වෙත ඉදිරිපත් කර තිබු නමුත් ඒ සම්බන්ධයෙන් මහා සභා තීරණයක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. අදාල ගොඩනැගිල්ල 2020 ජූලි 20 දින සිට 2023 ජූලි 19 දින දක්වා කාලයකට මසකට රු.2,000 ක තාවකාලික තක්සේරුවක් මත බදුදී තිබුණු අතර මාසික කුලී මුදල වර්ෂයකට වරක් ප්‍රතිශෝධනය වන බවට ගිවිසුමෙහි වගන්තියක්ද ඇතුලත් කර තිබු නමුත් එපරිදි කුලිය ප්‍රතිශෝධනය කර නොතිබුණි. තවද රජයේ තක්සේරුවක් ලබාගැනීමද මේ දක්වා කටයුතු කර නොතිබුණි. | මහා සභා තීරණය පරිදි තාවතාලික තක්සේරුවක් යොදා බදු ගැනීම සිදු කර ඇති අතර ඉදිරියේදී තක්සේරුවක් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. | රජයේ තක්සේරුවක් ලබාගෙන බදු දීම කළ යුතුවේ. |
| (iv) | නගර සභාව සතු පැලියගොඩ මැනිං වෙළඳ සංකීර්ණය 2022 මාර්තු 02 වන දින භෞතික පරීක්ෂාවේදී වෙළඳ සංකිර්ණයේ ක්‍රියාත්මක මුළු වෙළඳසැල් ප්‍රමාණය 1457 ක් බව නිරික්ෂණය වූ අතර නගර සභාව හඳුනාගෙන තිබු මුළු වෙළඳසැල් ප්‍රමාණය 626 ක් පමණි. එයින් 2021 වර්ෂයේදී නගර සභාව විසින් වෙළඳසැල් 496 කින් පමණක් බලපත්‍ර ගාස්තු අයකර තිබුණි. | සක්‍රියව පවත්වා ගෙන යන වෙළඳ සැල් පිළිබඳ වාර්තාවක් ලබා ගෙන බලපත්‍ර ගාස්තු අයකර ගන්නා බව දන්වමි. | වෙළඳ සංකීර්ණයේ ක්‍රියාත්මක මුළු වෙළඳසැල්වලින් බලපත්‍ර ගාස්තු අය කිරීම කළ යුතුවේ. |
| (v) | සමාලෝචිත වර්ෂයේ කුලී බිල් කළ මුදල වූ රු.1,916,000 කින් සමාලෝචිත වර්ෂයේ රැස් කර තිබුණේ රු.697,000 ක් පමණක් වන අතර 2022 මැයි 31 දිනට තවදුරටත් අයවිය යුතු මුදල රු.329,200 ක් විය. | පිළිතුරු ලබාදී නැත. | බිල් කළ මුදල රැස් කිරීමට කටයුතු කළ යුතුවේ. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

නගර සභා ආඥාපනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ජනවාරි 22 දින පැවති පරිසර හා සෞඛ්‍ය කමිටු වාර්තාවේ වෙනත් කරුණු යටතේ දක්වා ඇති පරිදි ව්‍යාපාරික කසළ සඳහා කසළ ගාස්තු අයකිරීමේදී මහා සභාවේ අනුමැතිය පරිදි ගිවිසුම්වලට එළඹීමෙන් පසු 2021 වර්ෂය සඳහා ගාස්තු අය කිරීමට වගකිව යුතු නිලධාරින් කටයුතු කළ යුතු බවත් කසළ කිරා මැන බැලීමට තරාදි ලබා දීමටත් තීරණය කර තිබුණි. මේ අනුව 2021 වර්ෂය සඳහා කසළ ගාස්තු අයකළ යුතු ආයතන ප්‍රමාණය භෞතික පරීක්ෂාවකින් නිසි පරිදි හඳුනාගෙන නොතිබුණි. ලේඛනය අනුව ආයතන 113 ක් හඳුනාගෙන ඉන් ආයතන 60 ක් පමණක් ගිවිසුම්ගත වී තිබූ අතර කමිටු තීරණය පරිදි කසළ කිරා මැනීමට තරාදි ලබාදී නොතිබුණි. | උපරිම කාර්යක්මතාවකින් මෙම ආයතනවලින් වාණිජ කසළ සඳහා ගාස්තු අයකර ගත් අතර මේ වන විට ආයතන 200කට ආසන්න ප්‍රමාණයක් හඳුනාගෙන ගාස්තු අය කිරීමට කටයුතු යොදා ඇති බව දන්වමි. | භෞතික පරීක්ෂාවකින් ආයතනහඳුනාගෙන කසළ ගාස්තු අය කිරීම කළ යුතුවේ. |

**3.2 මානව සම්පත් කළමනාකරණය**

**සේවක ණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දිනට මිය ගිය හා විශ්‍රාම ගිය නිලධාරින් 08 දෙනෙකුගෙන් රු.257,104 ක් ද, වැඩ තහනම් කළ නිලධාරින් 39 දෙනෙකුගෙන් රු.776,707 ක් ද හා සේවය අතහැර ගිය නිලධාරින් 06 දෙනෙකුගෙන් රු.717,053 ක් ද වශයෙන් මුළු මුදල රු.1,750,864 ක් වර්ෂ 1998 සිට 2012 කාල වකවානුව තුළ අය නොවී පැවතෙන අතර එම ශේෂයන් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව දනවමි. | හිග ශේෂ අය කිරීමට කටයුතු කළ යුතුවේ. |

## 3.3 කසළ කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| නගර සභා කසළ අංගනයේ කසළ තුනී කිරීම සඳහා කුලී පදනම මත යන්ත්‍රයක් ලබාගෙන තිබූ අතර තුනී කිරීමට අපේක්ෂිත කසළ ප්‍රමාණය ඒ සඳහා වැයවන යන්ත්‍ර පැය ගණන ආදිය පිළිබඳ නොසලකා 2020 ජුනි 23 දින පැවති මුදල් කමිටුව මේ සඳහා අනුමැතිය ලබාදී තිබුණි. 2020 හා 2021 වර්ෂවලදී යන්ත්‍ර පැය මත පදනම්ව මෙම යන්ත්‍රය සඳහා ගිවිසුම්ගත ආයතනය වෙත රු.2,844,800 ක මුදලක් ගෙවා තිබුණි. 2021 සැප්තැම්බර් 01 දින සිට ඔක්තෝබර් 01 දින දක්වා කාලය තුළ කසළ තුනී කිරීමේ යන්ත්‍රයේ මීටරය ක්‍රියා විරහිත තිබියදී යන්ත්‍ර පැය 68.9 ක් සඳහා රු.122,150 ක මුදලක් ගෙවා තිබූ අතර ඒ සම්බන්ධව ගිවිසුමේ කිසිදු කොන්දේසියක් දක්වා නොතිබුණි. එසේම ඔක්තෝබර් 01 දින සිට 13 දින දක්වා කසළ තුනී කිරීමට යන්ත්‍ර පැය 18.7 ක් පමණක් වැය කර තිබුණද පැය 33.3 ක් සඳහා රු.49,000 ක් ගෙවා තිබූ බැවින් පැය 14.6 ක් සඳහා රු.16,275 ක් වැඩිපුර ගෙවා තිබුණි. | නැවත ගිවිසුම් ගතවීමේදී මීටරය ක්‍රියා විරහිත අවස්ථාවලදී කටයුතු කල යුතු ආකාරය පිළිබඳ ගිවිසුමට ඇතුලත් කිරීමට කටයුතු කරන බවත් දිනකට යන්ත්‍රය සඳහා උපරිම පැය 04 ක් සඳහා ගෙවීම් කටයුතු සිදු කරන බැවින් රු 49,000 ක මුදලක් ගෙවීම සිදු කර ඇති බවත් දන්වමි. | අවශ්‍ය කොන්දේසි ඇතුළත් කර ගිවිසුමට එළඹීමට කටයුතු කළ යුතු අතර නිසි අධීක්ෂණයකින් කසළ කළමනාකරණ කටයුතු සිදු කළ යුතුවේ. |